

# සිනාවී
## සෙනෙහෙබර සැන්දෑවක්

ජගත් ජේ එදිරිසිංහ

සිය දක්ෂතා පූර්ණ දියණිය වේදිකාව මත තබා ඇගේ දස්කම් දෙස බලා ඉන්නා ආඩම්බරකාර තාත්තා වාසනාවන්තයෙකි. එවන් වාසනාවන්ත පියෙකු දැක ගැනීමේ වාසනාව පසුගිය ප්‍රේල් 30 වන දා අපි වින්දෙමු. තාත්තා ප්‍රවීණ ගීත රචක සිසිර දිසානායක යි. දියණිය සරිනි දිසානායකයි. සරිනි දිසානායකගේ කුළුඳුල් සංගත තැටිය යටතේත් ඇය ලබාගත් සංගීතඥානය මේ වේදිකාව මතට එන්නට ඇයට ශක්තිය සැපයූ බව නිසැකය. ඇලේ ගැයුම් බලා සිටීම ආශ්වා දයක්ම විය. ඒ ඇය අපේ දියණියක වීම නිසා ය. වච-නයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඈ ඇගේ සන්ධ්‍යාව සිනාවෙන් පුරවා දැමුවා ය. වේදිකව ඇගේ තාරුණ්‍යයේ ප්‍රහර්ශයෙන් දිදුලෙව්වා ය. දැඩි ආත්ම විශ්වාසය අපට ඔප්පුකොට පෙන්වා දුන්නාය.



ඡායා රූ - බන්දුල කැඳුරුගම

"සිනාවී"ප්‍රසංගය මැනැවින් සංවිධානය කර තිබුණ ප්‍රසංගයක් විය. සවස 6ට ආරම්භ කරන්නට නියමිතව තිබූ ප්‍රසංගය හරියටම ඒ වේලාවට ආරම්භ කිරීම කලට වේලාවට වැඩ කරන්නන්ට කළ ආශිර්වාදයක්ම විය. මෙපුර සෑම ප්‍රසංගයක්ම මේ ආදර්ශය ඉදිරියටම ගෙන යා යුතුය. එය පමා වී උත්සව වලට එන්නට පුරුදු වී සිටින අපේ සමාජයේ බොහෝ අයගේ ඇස් අරවනු ඇති බව නිසැකය.



දොරට වැඩුම නිමිති කරගෙන පැවැත්වුණ " සිනාවී" සංගීත සැන්දෑව කරුණු කිපයක් අතින්ම අප කලකින් නොදුටු ආකාරයේ වැදගත් සන්දර්ශනයක්ම විය.

පළමුව එය අපේ දෙවන පරපුරේ ගායිකාවක දොරට වැඩි සැන්දෑව විය. මේ ගමන එන්නට සරිනි බොහෝ පෙරුම්පුරා සිටිය බව අපි දනිමු. ඒ වෙනුවෙන් වසරක් දෙකක් නොව වසර ගණනාවක් ඇය සංගීතය හැදෑරුවාය. මෙරටදී විශාරද වාසනා වීරකෝන් මහත්මිය යටතේත් ලංකාවේදී ආනන්ද වීරසිරි සංගිතවේදියාණන්

ප්‍රසංගයේ ගලා යාමද මැනැවින් සිදුවිය. කිසිදු හැලහැප්පීමකිනවි තොරව ගලා යාම රැකගන්නට සංවිදායකයන් ගත් උත්සාහය නිරඹන්නන්ට පහ-සුවක් විය. වේදිකා අලංකාරය මෙන්ම ආලෝකක-රණයද ප්‍රශස්ත මට්ටමක පැවැතුනි. නිවේදක



යුවලද සිය කාර්යය මැනැවින් කරන්නට උත්සාහ ගත් බව පෙනුණි. මේ සැමගේම එකමුතුවෙන් බිහිවුණ ප්‍රසංගය නරඹන්නන්ට ආශ්වාදනීය සැන්දෑවක් ලබා දුන්නේ ය.

ප්‍රසංගයේ වඩාත්ම වැදගත් ආංගයක් වූයේ මෙනුවර තරුණ තරුණියන් කීපදෙනෙකුටම සිය දක්ෂතා පෙන්වන්නට අවස්ථාව සළසා දීමයි. මේ තරුණ දරුවන් සහ දැරියන් - විශාරද මනීෂ විජේකෝන්, හෂිනි ඉලංගරත්න, මහීෂ ගමගේ, හංසිකා සඳලි වයස්, අශ්විනි දහනායක - අපේ සමාජයේ කැපී පෙනෙන තරු බවට පත් වන ලකුණු ඒ සැන්දෑවේදී අප ඉදිරියේ ප්‍රදර්ශනය කළ බව සටහන් කර තබනු කැමැත්තෙමි.

ඉන්ද්‍රජිත් මිරිහාන සොයුරාගේ සංගීතය ඉතා ඉහළ මට්ටමක විය. ප්‍රවීණ ගීත රචක සුනිල් සරත් පෙරේරා මහතාගේ සහභාගිත්වය උත්සවයට එක් කළ ආලෝකයක්ම විය. නර්තනාංග පවා මැනැවින් ඉදිරිපත් කෙරුණි. ඒවා පුරුදු පුහුණු කළ ගුරුවරුන්ටත් දායක වූ දැරියනටත් අපේ පැසසුම හිමිවෙයි. ප්‍රසංගයේ සමස්ථ සංවිධානය ඉතා ඉහළ මට්ටමක පැවතුණ බව ලියන්නේ ඒ සඳහා දායක වූ සියල්ලන්ට තුති පිදීම සඳහා ය.

සරිනි වෙනුවෙන් සිසිර ලියූ ගී පද ආශ්වා දජනකය.

සරිනි දියණිය බොහෝ හැකියා ඇති කලාකාරියකි. සතත අභ්‍යාසය ඇය තවත් බො-හෝ දුර ගෙන යනු ඇති බව අපට විශ්වාසය. ඒ වෙනුවෙන් ය මේ සුබ ප්‍රාර්ථනය

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com